M131
A

# නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ සාදාචාරාත්මක චර්යාවන් කෙරෙහි බලපාන සමාජීය විචල්‍යයන් කිහිපයක් ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයට
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයයි

UCLIB
383653

1982 මාර්තු 31

එල්. ඩී. එස්. සිල්වා
එම්. ෆිල්. 90

# හැ ඳි න් වී ම

අධ්‍යාපනය, සමාජානුයෝජනය, සදාචාරය හා නවයෞවනය යන සංකල්ප න්‍යූතන දාර්ශනික, සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක පර්යේෂණ ක්ෂෙත්‍රයන්හි අධ්‍යයනයට හා විමර්ශනයට ලක්වන සංකල්ප කිපයකි. මේවා කිසියම් සමාජයක සාමාජිකයන් හා ඔවුන්ගේ චර්යාරටාවන් හා සම්බන්ධතාවන් ග්‍රහණය කරන සමාජවිද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පදනමක් මත ගොඩනැගුණු සංකල්ප කීපයකි. අධ්‍යාපන ක්ෂෙත්‍රයෙහි පර්යේෂණ හා විමර්ශන කටයුතු වල නිරතවන්නට අවශ්‍යයෙන්ම මෙම සංකල්ප ගැන අවධානය යොමුකිරීමට සිදුවන්නේ එම ක්ෂෙත්‍රයෙහි පැන නැගෙන ගැටළු හඳුනාගැනීමටත් ඒ සඳහා විසඳුම් සෙවීමටත් එබඳු විමර්ශන අතිශයින්ම ප්‍රයෝජනවත් වන බැවිනි.

මෙම සංකල්ප එකිනෙක අතර පවත්නා සම්බන්ධය කෙටියෙන් විග්‍රහ කර බැලුව හොත් අධ්‍යාපනික ක්‍රියාවලියෙහි ලා සලකන විට ඒවායෙහි පවතින දැඩි සම්බන්ධතාවය හෙළිවෙයි. 'සමාජානුයෝජනය' යන සංකල්පයෙන් ඉතා සරලව අදහස්වන්නේ කිසියම් සමාජයකට බිහි වූ නව සාමාජිකයෙක් එම සමාජයෙහි ජීවත්වෙමින් එහි පවත්නා ජීවන රටාව, ඇගයුම්, සිතුවිලි, දැනුම් ආදී සංස්කෘතියෙහි සියලුම අංග උකහා ගනිමින් එම සමාජයේ පූර්ණ සාමාජිකත්වය පුද්ගලයාට ලබා ගැනීමට මං පාදන ක්‍රියාවලියක් සමාජය විසින් පුද්ගලයා කෙරෙහි එල්ල කෙරෙන බලපෑමක් පිළිබඳ ක්‍රියාවලියක් ගැනයි.

'අධ්‍යාපනය' යන සංකල්පයෙන් ප්‍රකාශිත වන සරල අදහස පුද්ගල චර්යාවේ වෙනස්කම් ඇති කෙරෙන්නාවූත්, පුද්ගලයා කිසියම් සමාජයක ජීවත්වීමේදී ලබන අත්දැකීම් පිළිබඳව වූත් ක්‍රියාවලියක් සම්බන්ධ වූවකි. මේ අනුව එය ඉහත දැක් වූ සමාජානුයෝජන ක්‍රියාවලියේම අන්තර්ගත වූවක් බව පැහැදිලිවෙයි.

කිසියම් සමාජයක් හෝ මුළු මහත් මිනිස්වර්ගයා තුළ ම හෝ දීර්ඝකාලීන අත්දැකීම් තුළින් පොදුවේ ගොඩනගාගෙන ඇති ඇගයුම්, පරමාදර්ශ හා සම්මතයන් අනුව සැකසුණු එමෙන්ම පුද්ගල චර්යා, විනිශ්චයන් සහ අරමුණු ආදිය පිළිබඳව 'හොඳ','නරක' හෝ 'හරි','වැරදි' ආදි වශයෙන් ඇගයුමකට භාජනය කිරීම පිණිස යොදාගන්නා ප්‍රතිමාන පද්ධතියක් පිළිබඳ අදහසක් 'සදාචාරය' යන සංකල්පයෙන් ප්‍රකාශිත වේ. මෙම ප්‍රතිමාන පද්ධතීන් සමාජයක සාමාජිකයන් තුළ ගොඩනැගෙන්නේ ඉහත සඳහන් කළ සමාජානුයෝජන ක්‍රියාවලිය හා අධ්‍යාපනික ක්‍රියාවලිය මගින් ක්‍රියාත්මක වන බලවේගයෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

මෑත යුගයේ ඇති වූ සමාජ පරිණාමයේ හා සංකීර්ණත්වයේ ප්‍රතිඵලයක් ලෙස පැන නැගුණු සමාජ නිර්මිත ජීවන අවදියක් ලෙස හැඳින්විය හැකි, සමාජයකට බිහි වූ නවක සාමාජිකයෙක් එම සමාජයේ පූර්ණ වැඩිහිටිභාවය ලබාගන්නා තෙක් සිදුවන වර්ධනයේ එක් අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි, ජීවිතයේ දෙවන දශකය මුළුමනින්ම ඇතුල්වන කාල පරිච්ඡේදය ගත කරන පුද්ගලයන් අත් දකින්නා වූ ජීවන අවදිය 'නවයෞවනය' යන සංකල්පයෙන් හඳුන්වනු ලැබේ. කායික හා මානසික වශයෙන් වැඩිහිටියකුගේ තත්වයට සමාන පරිණත බවක් ලැබුවත් නූතන සමාජයේ සංකීර්ණ ස්වභාවය නිසා සමාජීය වශයෙන් හා අත්දැකීම් අතින් ජීවිතයේ දෙවන දශකය ගත කරන පුද්ගලයකුට හිමිවන්නේ අඩු තත්වයකි. මේ අත්දැකීම් අඩුබව නිසා නවයෞවන අවදියගත කරන පුද්ගලයා සමාජීය වශයෙන් අඩු පරිණත බවක් දක්වයි. එබැවින් නවයෞවන අවදිය ගත කරන පුද්ගලයා තවදුරටත් සමාජානුයෝජනයට හෙවත් සමාජ අත්දැකීම් ලැබීමට යොමු විය යුතුයි. එහිලා නූතන සමාජයේ අධ්‍යාපන ක්‍රියාවලිය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරන බව පෙනී යයි.

නවයෞවනයකු මානසික හා කායික වශයෙන් සෑහෙන තරම් පරිණතියක් ලබා සිටින බැවින් සමාජය අනුමත කරන චර්යා රටාවන් ගොඩනගා ගැනීමටත්, ඇගයුම් හා විනිශ්චයන් ඇති කරගැනීමටත් සමාජයේ උසස් යයි සම්මත ප්‍රතිමාන ( Norms) භාවිතා කිරීමේ හැකියාව ලබා ගැනීමට ඔහු යෝග්‍ය පුද්ගලයෙක් වේ. එමෙන්ම සමාජය නව යෞවනයකු-ගෙන් මෙම සමාජ ප්‍රතිමාන හා ඇගයුම් අනුව සකස් කරගන්නා ලද සදාචාරාත්මක හා ආචාරධර්මාත්මක ප්‍රතිමානවලට අනුකූලවීමක් බලාපොරොත්තු වියහැකිය. එනමුත් අත්දැකීම් අංශයෙන් අපරිණත පුද්ගලයෙක් වශයෙන් නවයෞවනයා තුළ එබඳු ඇගයුම් හා ප්‍රතිමාන ගොඩනගා ගැනීමේදී සමාජ අත්දැකීම් ලැබීමේ අවශ්‍යතාවක් හටගනී.

පුද්ගලයකු අත්දැකීම් ලබන්නේ සමාජයක් තුළයි. එම සමාජයේ පවතින විවිධ සමාජ කණ්ඩායම්, සමාජ විෂමතාවයන් සහ සමාජ පිළිගැනීම් සියල්ලම ඔහු ලබන අත්දැකීම් වලට පිටුවහල් වේ. එනමුත් එක් එක් සමාජ කණ්ඩායම් වල ව්‍යුහයන් එකිනෙකට වෙනස් වන බැවින් ඒ එකිනෙක මගින් පුද්ගලයාට ලබාදෙන අත්දැකීම් ද වෙනස් වේ. එමනිසාම ඒවා පදනම් කොටගෙන පුද්ගලයාට ගොඩනගා ගැනීමට ලැබෙන සමාජ ඇගයුම්, පිළිගැනීම් හා චර්යාරටාවන් විවිධ වේ. මේ නිසා අපරිණත, අත්දැකීම් අඩු, පුද්ගලයකු වශයෙන් සමාජ අත්දැකීමට යොමුවන පුද්ගලයා විවිධ සමාජ කණ්ඩායම්වල පිළිගැනීම් හා ඇගයුම් පිළිබඳ ප්‍රතිමාන වලින් යෝග්‍ය ඒවා තෝරා ගැනීමේ ගැටළුවකට මුහුණ දෙයි. එමනිසා නවයෞවනයා නිතරම සමාජයේ පවතින අසංගත ස්වභාවයට ගොදුරුවෙයි. එහෙයින් නවයෞවනයා යෝග්‍ය වැඩිහිටි චර්යා හා ඇගයුම් ඇති පුද්ගලයකු බවට පත් කර ගැනීමට නම් සමාජය පොදුවේ පිළිගන්නා උසස් යයි සම්මත ඇගයුම් ප්‍රතිමාන හඳුනාගැනීමටත්, ඒවා අත්දැකීමටත්, එම අත්දැකීම් තුළින් සමාජ සම්මත ආචාරධර්මාත්මක චර්යා රටාවන් ගොඩ නගා ගැනීමටත් ඒ සඳහා අවශ්‍යවන විනිශ්චය හැකියාවන් ලබාගැනීමටත් මග සැළසියයුතුයි.

එම කාර්යය ඉටු කිරීමෙහිලා අවිධිමත් ලෙසත් අසංවිධිත ලෙසත් සමාජයේ ක්‍රියාත්මක වන සමාජානුයෝජන ක්‍රියාවලිය ප්‍රමාණවත් නොවන බැවින් අරමුණු සහ පරමාර්ථ අනුව ගොඩනගන ලද සංවිධිත අධ්‍යාපන ක්‍රියාවලියට එහි ලා වැදගත් කාර්ය භාරයක් පැවරෙයි. එමනිසා අධ්‍යාපනික ක්ෂේත්‍රයෙහි නිරතවන්නන් විසින් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස නවයොවුන් වියේ සදාචාරාත්මක වර්ධනය ගැන සළකා බැලිය යුතුයි. විශේෂයෙන්ම සදාචාරාත්මක ඇගයුම් හඳුනා ගැනීමටත්, ඒවායේ හර අවබෝධ කරගැනීමටත්, එමගින් ස්වාධීන විනිශ්චයයන්ට එළඹීමටත් ඊට අනුකූල තම චර්යාවන් හැඩගස්වා ගැනීමටත් යෝග්‍ය මානසික සංවර්ධනයක් නව යෞවනයා ලබා සිටින හෙයින් ඊට පදනම් වන යෝග්‍ය සමාජමය අත්දැකීම් ලැබීමට ඉඩ සැලසීමෙහි ලා අධ්‍යාපනය ඉතා වැදගත් මාධ්‍යයක් වේ. නවයොවුන් අවදිය නූතන සමාජයේ ක්‍රියාත්මක වන පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට පුද්ගලයන් හසුකරගන්නා අවදියක් වන බැවින් මේ කරුණ වඩාත් වැදගත්වෙයි.

පුද්ගලයා සමාජයක පූර්ණ සාමාජිකයකු ලෙස පිළිගැනීමට යෝග්‍ය අත්දමින් හැඩ ගැසීමේ ලා ඉතාම වැදගත් අවදියවන නවයොවුන් විය හැඩගැසීම (Adjustment) පිළිබඳව ඉතා සංකීර්ණ ගැටළු රැසක් පැන නැගෙන අවදියකි. ඒ නිසාම 'නවයෞවනය'

නූතන සමාජවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රවලත් ජන සන්නිවේදන මාධ්‍යයවල හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිත් විමර්ශකයන්ගේ හා පර්යේෂකයින්ගේ අවධානය යොමුවන කේන්ද්‍රීය සංකල්පයක් බවට පත්වී තිබේ. මෙම සංකල්පයෙන් නිර්වචනය කෙරෙන වයස් කාණ්ඩයට අයත් පිරිස මුළු ලෝකය පුරාම නූතන සමාජ බලවේගයක් වශයෙන් විවිධ අන්දමේ ආන්දෝලනයන් ඇති කිරීමට මූලික වී ඇති හෙයින් 'නවයෞවනය' පිළිබඳව විවිධ අංශ ගැන විවිධ දෘෂ්ටිකෝණවලින් බලා විවිධ විග්‍රහයන් ඉදිරිපත් කිරීමට ජාත්‍යන්තර හා ජාතික ආයතනද පර්යේෂකයන්ද පෙළඹී තිබේ. එහෙයින් මේ සම්බන්ධව කරන ලද පර්යේෂණ රාශියක් දක්නට ලැබෙයි. සෑම සමාජයකම තම බාල පරපුරට අනාගතය භාරදීමේ අරමුණ ඇතිව ඔවුන් පරිණත සාමාජිකයන් බවට පත්කරගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින් නවයෞවනයන් පිළිබඳව සෑම සමාජයකම අවධානය අනිවාර්යයෙන්ම යොමු වී පවතින බව පෙනේ. එහෙයින් මෙම අධ්‍යයනයද ශ්‍රී ලංකාවේ නවයොවුන් පරපුර සමාජය පිළිගන්නා සදාචාරාත්මක චර්යාවන්ට අනුකූලව හැඩගස්වා ගැනීමේ ලා ඉවහල්වන සමාජමය සාධක අධ්‍යයනය කිරීමට යොමු වූ බව සඳහන් කළයුතුයි.

මෙම පර්යේෂණය නවයොවුන් වියේ පාසල් සිසුන්ගේ සදාචාරාත්මක චර්යාවන් කෙරෙහි සමාජ කණ්ඩායම්, සමාජාර්ථික පංති රටාව, ගම්බද හෝ නාගරික සමාජ පරිසරය, පුද්ගලයාට හිමි ස්ත්‍රී හෝ පුරුෂ සමාජ භූමිකාව යන සමාජ සාධක වල බලපෑම හා එහි ස්වභාවය පිළිබඳව කෙරෙන අධ්‍යයනයකි. මේ අනුව පුද්ගලයා සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන විවිධ සමාජ කණ්ඩායම් වල ස්වභාවය අනුව ඔහුට එම සමාජ කණ්ඩායමෙන් ලැබෙන බලපෑම අනුව ඔහුගේ සදාචාරාත්මක චර්යා වෙනස් වන්නේද? එවැනි වෙනස්වීමක් පවතින්නේ නම් එය කෙබඳු ස්වභාවයක් ගන්නේද? යන කරුණු කෙරෙහි මෙහිදී මූලික වශයෙන් අවධානය යොමුවේ.

මෙම අධ්‍යයනයට නවයොවුන් වියේ පාසල් සිසුන් තෝරා ගැනීමට යොමුවීමට බලපෑ හේතු සාධක කීපයකින් ඉතාම වැදගත් කරුණක් වන්නේ නවයොවුන් පරපුර නූතන සංකීර්ණ සමාජය තුළ දක්නට ලැබෙන සමාජ රටාවන්, සමාජ විෂමතාවන්ට අතිශයින්ම ගොදුරුවන කණ්ඩායමක් ලෙස නූතන සමාජ විද්‍යාඥයින් හඳුන්වාදී තිබීමයි. එමනිසා සමාජමය බලපෑම් නවයෞවනයාගේ සදාචාරාත්මක චර්යා කෙරෙහි කෙබඳු ආකාරයකට

පතිත වන්නේදැයි විමර්ශනය කිරීම වැදගත් කරුණක් ලෙස පෙනේ. විශේෂයෙන්ම මෙහිදී අවධානය යොමුවන ගැටළුව විවිධ සමාජ කණ්ඩායම් වලට සම්බන්ධවෙමින් පුළුල් සමාජ පරිසරයක් අත්දකින නූතන නවයෞවනයාට එමගින් ලැබෙන අසමාන, අසංගත අදහස් ඇගයුම්, හා අත්දැකීම් තුළින් පොදු එමෙන්ම සමාජ සම්මත ප්‍රතිමාන වලට අනුකූල චර්යා රටාවන් ගොඩනගා ගැනීමට ඉවහල්වන පසුබිමක් සැපයීමේ හැකියාවක් තිබේද යන්නයි.

පුද්ගලයකු තම මූලික සමාජ කණ්ඩායම වන පවුලෙන් හා එහි ප්‍රබල සාමාජිකයන් වන දෙමාපිය වැඩිහිටියන්ගේ ලබාගන්නා හැසිරීම පිළිබඳ ආදර්ශය අනුව අනුකරණය, අනුවින්දනය ඇගවියාව යන සමාජානුයෝජන ක්‍රියාවලියේ විවිධ අංශවලදී අභ්‍යන්තරීකරණය කරගන්නා චර්යා රටාවන් හා ඇගයුම් පද්ධතීන් අනුව ඔහුගේ හැසිරීම මෙහෙයවේ. ළමයකු වශයෙන් ඔහු ලබන එම අත්දැකීම්වල ස්වභාවය නවයොවුන් අවදියට පත්වීමත් සමග ක්‍රමයෙන් පුළුල්වන සංකීර්ණ සමාජයක ලබන අත්දැකීම්වල ස්වභාවයට වඩා වෙනස්වීමට ඇති ඉඩකඩ බොහෝය. දෙමාපියන් හා පවුල සමාජානුයෝජන කාරකයන් වශයෙන් අනුගමනය කරන ඔවුන්ගේ දරුවන් හැදීමේ වැඩීමේ රටාවන් ( Child rearing practices) දරුවකුගේ සදාචාරාත්මක චර්යාවන්, විනිශ්චයයන් ආදිය කෙරෙහි ඉමහත් බලපෑමක් කරන බව ළමා සංවර්ධනය ගැන කරන ලද මනෝවිද්‍යාත්මක අධ්‍යයන මගින් පෙන්වා දී ඇත. මේ අධ්‍යයන වලදී විවිධ සමාජ - ආර්ථික පංති රටාවන් අනුවත්, නාගරික හා ග්‍රාමීය වශයෙන් ගොඩනැගෙන විවිධ සමාජ සංකීර්ණයන් තුළ පවතින සමාජ පරිසරයේ ස්වභාවය අනුවත්, දෙමාපියන් හා පවුල වෙතින් පුද්ගලයා කෙරේ එල්ලවන සමාජ බලපෑම් හා ඔහුට අත්දැකීමට ලැබෙන සමාජ අවස්ථාවන් වෙනස් බව පෙන්වා දී ඇත. විශේෂයෙන් ම දෙමාපිය-දරු සම්බන්ධතාවය කෙරෙහි සමාජ විෂමතා භෞතික හා මානසික වශයෙන් ඇඩීව බලපායි. එමනිසා මූලික සමාජ කණ්ඩායමක් ලෙස පවුල හෙවත් දෙමාපියන් කෙරෙන් පුද්ගලයාගේ චර්යාව කෙරෙහි ඇතිවන බලපෑම විවිධ සමාජ විෂමතාවන් අනුව විවිධ වේ නම් ඒවා පුද්ගලයාගේ සදාචාරාත්මක ඇගයුම් කෙරේ සහ ඒ අනුව මතුවන සදාචාරාත්මක චර්යාවන් කෙරෙහි ඇතිකරන බලපෑම කෙබඳුද යන්න මෙම අධ්‍යයනයේදී විමර්ශනයට ලක් කෙරෙයි.

පුද්ගලයා නවයොවුන් වියට එළඹීමත් සමගම ඔහුගේ සමාජ පරිසරය පුළුල් වීමේදී පාසල හා එහි පවත්නා සමාජ කණ්ඩායම් සමග ඉතා දැඩි සම්බන්ධතාවන්ට ඔහු යොමුවීම

නූතන සංකීර්ණ සමාජයේ පොදු ලක්‍ෂණයකි. පාසල් සමාජයක් තුළ පවතින සමාජ ව්‍යූහයේ ඉතා වැදගත් අංශ දෙකක් නම් එහි සමාජයේ පරිණත පුද්ගලයන්ගේ භූමිකාවන් නිරූපණය කරන ගුරුවරුන් හා සමාජයට ගැළපීමේලා අවශ්‍ය අත්දැකීම් ලබාගනිමින් සිටින . අපරිණත සාමාජිකයන්ගේ භූමිකාව නිරූපණය කරන ශිෂ්‍යයින්ය. මෙහිදී ප්‍රබල පරිණත සාමාජිකයන් වෙතින් අපරිණත සාමාජිකයන් වෙත කෙරෙන සමාජමය බලපෑමක් සංවිධිත මෙන්ම අසංවිධිත රටාවකින් ක්‍රියාත්මක වෙයි. මෙහිදී වැඩිහිටි සාමාජිකයන් කණ්ඩායමක් වශයෙන් ගුරුවරුන් නමැති සමාජ කණ්ඩායම හා සමාන පුද්ගලයන් වශයෙන් සිටින ශිෂ්‍යයන් 'සමපද්‍යාවර කණ්ඩායම' නමැති සමාජ කණ්ඩායම සමග දෙයාකාර සම්බන්ධතාවකට යොමු වෙයි. මෙම සමාජ කණ්ඩායම් දෙකේ ව්‍යූහය එකිනෙකට අසමාන වන අතරම එමඟින් පුද්ගලයා වෙත කෙරෙන බලපෑම් ද වෙනස් වේ. ගුරුවරුන් සමාජය පිළිගත් ප්‍රතිමාන අනුව පරිණත චර්යා රටාවන් හැඩගස්වාගත් වැඩිහිටියන් වශයෙන් නවයෞවනය සමග ඇතිකරගන්නා සම්බන්ධතා රටාව නිසා ඔහුට එම සමාජ කණ්ඩායම තුළ හිමිවන භූමිකාව සමාන එකක් නොව ද්විතීයික එකකි. අනෙක් අතට අත්දැකීම්, රුචිකම්, ශාරීරික හා මානසික ස්වභාවයෙන් බොහෝදුරට සමාන පුද්ගලයන්ගෙන් සමන්විත සමපද්‍යාවර කණ්ඩායම තුළ නවයෞවනයාට හිමිවන්නේ වඩා ස්වාධීන භූමිකාවකි. එමෙන්ම චර්යා රටා ඇගයුම් හා විනිශ්චයන් පිළිබඳ ප්‍රතිමාන ගැන වැඩිහිටි ගුරු සමාජ කණ්ඩායමෙන් ලැබෙන අත්දැකීම් හා පරිණත තත්වයට නොපැමිණි සමපද්‍යාවර කණ්ඩායමෙන් ලැබෙන අත්දැකීම අසමාන වේ.

මේ අනුව පුද්ගලයා වැඩිහිටි ගුරුවර දෙමාපියන් සම්බන්ධවන පරිණත පුද්ගලයන්ගේ සමාජ කණ්ඩායමෙන් හා සමපද්‍යාවරයන් සම්බන්ධවන අපරිණත පුද්ගලයන්ගේ සමාජ කණ්ඩායමෙන් ලබන අත්දැකීම්වල පවතින අසංගත ස්වභාවය සහ එම කණ්ඩායම් සමග පුද්ගලයා පවත්වන මනෝවිද්‍යාත්මක සම්බන්ධතාවල ස්වභාවය පුද්ගල චර්යා රටා සැකසීම කෙරෙහි බලපාන්නේ කෙබඳු ආකාරයකටද යන ගැටළුව මතුවේ. එමෙන්ම නවයොවුන් විය පිළිබඳව අධ්‍යයන විශාල සංඛ්‍යාවක් කරනු ලැබුවත් නවයොවුන් වියේ වර්ධනයේ ස්වභාවය ගැන සමාජ මනෝවිද්‍යාත්මක වශයෙන් කරනු ලැබූ පර්යේෂණ මෑතක් වනතුරුම එතරම් බහුල නොවීය. එමනිසා නවයොවුන් වියේ සමාජමය සම්බන්ධතාවන් ගැන ගොඩනගා ගන්නා ලද සාමාන්‍යකරණ කරන ලද න්‍යාය රාශියක් දක්නට නොලැබෙයි. බොහොමයක් පර්යේෂකයින් නවයොවුන් සමාජමය සම්බන්ධතා රටාව ගැන දක්වන අදහස් අංශ දෙකකින් ගොනු කළ හැකිය.

එක් පර්යේෂක කණ්ඩායමක් ඔවුන්ගේ දෘෂ්ටිකෝණය අනුව නවයොවනයන් නිතරම වැඩිහිටි පරපුර සමග ගැටුම් ඇතිකර ගන්නා එමෙන්ම තම සමපදස්ථ කණ්ඩායම් සාමාජිකයන් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පවත්වා ගන්නා සමාජ විරෝධී ලෙස ක්‍රියාකරන කණ්ඩායමක් ලෙස දකිති. මේ අදහස අනුව 'යොවුන් සංස්කෘතිය'(Youth Culture) පිළිබඳ සංකල්පය මතුකරගත් අතර වැඩිහිටි අදහස් හා ඇගයුම් පද්ධතීන් ප්‍රතික්ෂේප කරන සමපදස්ථයන්ගේ ඇගයුම් රටාවන්ටම අනුකූලව ක්‍රියාකරන ස්වාධීනත්වය සහ ස්වෛරීභාවය ලබාගැනීම සඳහා අරගලයක යෙදෙන තරුණ පිරිසක් ගැන එම සංකල්පය අනුව විග්‍රහ කරනු ලැබිය. 1942 දී පාර්සන්ස් විසින් මුලින්ම මෙබඳු වෙනස් සංස්කෘතියක් ගැන අදහස් ප්‍රකාශ කළ අතර ඉන්පසු කරන ලද පර්යේෂණ[1] රාශියකින් වැඩිහිටි අපේක්ෂණ හා අධිකාරි බලයට විරුද්ධවෙමින් ස්වාධීනත්වය සෙවීම හා සමපදස්ථ කණ්ඩායම කෙරේ අනිවාර්ය අනුකූලතාවක්(Compulsive Conformity) දැක්වීම යන ලක්ෂණ දෙක මෙම සංස්කෘතියේ ලක්ෂණ ලෙස පැහැදිලි කර ඇත.[2]

අනෙක් පර්යේෂක කණ්ඩායම නවයෞවනයන් සමාජයේ වෙනම සංස්කෘතික රටාවක් ගොඩනගාගනිමින් ක්‍රියාත්මක වන වැඩිහිටි ඇගයුම් ප්‍රතිමාන ප්‍රතික්ෂේප කරන සමාජ කණ්ඩායමක් වශයෙන් දැකීම ප්‍රතික්ෂේප කරන අතර 'යෞවන සංස්කෘතිය' පිළිබඳ සංකල්පය මිථ්‍යාවක් ලෙස සළකති. මේ අදහස් මුලින්ම ප්‍රකාශ කළේ එල්කින් (Elkin) හා වෙස්ට්ලි (Westly-1955) යන අයයි.[3] ඔවුන්ගේ මෙම අදහස පසුකලක බ්‍රිටන්[4] (Brittain-1963) මස්ග්‍රොව්[5](Musgrove-1964) වැනි අයට ඔවුන්ගේ පර්යේෂණ මගින් සමපදස්ථ කණ්ඩායම නවයෞවන සංස්කෘතිය හා එහි බලපෑම ගැන ඉහත දැක් වූ අදහස් ප්‍රශ්න කිරීමට පෙළඹවීමක් වූ බව පෙනේ.

මෙම අදහස් අනුව නවයොවුන් විය ගැන කරනු ලබන පර්යේෂණ වලදී එහි ස්වභාවය ගැන අංශ දෙකකින් හෙවත් දෘෂ්ටිකෝණ දෙකකින් ගැටළු දෙස බැලීමෙහි ප්‍රතිඵල වශයෙන් ඒ පිළිබඳ ගොඩ නගා ඇති න්‍යාය ඇතොත් ඒවා එකිනෙකට විරුද්ධ අංශ දෙකක් වශයෙන්

---

1. F.S.Niles - 1968 , p.5
2. Coleman J.S. The Adolescent Society - 1961
3. Elkin,F & Westley,W.A.,1955 -The Myth of Adolescent Culture,Amer.Social Rev.20, pp.680-684
4. Brittain,C.V.,1963, "Parent vs Peer Group Cross Pressure: Amer.Social Rev.28 pp.385
5. Musgrove.F.,1964, Youth and Social Order,Routhledge & Kagan Paul - London Reported by F.S.Niles